ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගම - 2019/2020
------------------------------------------------------------

1.1 මතය
------

ලංකා ලේලන්ඩ් (පුද්ගලික) සමාගමේ (සමාගම) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීම් ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කලයුතු යයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම
-------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ  මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශ්වයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

1.4 විගණන විෂයපථය

----------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේසාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන . නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇතදි තනි වංචා සහ වැර . මාණාත්මකහෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රසාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත .

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍යය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීමඅදාළ වන , වන පරිදි ගනුදෙනු සටහන් කිරීමට අවශ්‍ය කාශන පිළියෙල ප්‍රමිතිවලට අනුකූලව මූල්‍යවාර්තාකරණ ප්‍ර කිරීම සහ වත්කම් සඳහාගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාමකළමනාකාරීත්වයේ පොදු සහ , සටහන් කරන ලද වත්කම් සඳහා වූ ,වේශ විමනිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍ර සඳීම සහ වෙනස්කම් ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැ ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමටප්‍රමාණවත් ''මනා ලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ .

**02. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.115,969,314 ක ලාභයක් වූ අතරඊට අනුරූප ඉකුත් , වර්ෂයේපාඩුව රු. 502,041,856 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.618,011,170 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

**03. කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| (i) සමාගමේ කළමනාකරණ මණ්ඩලය විසින් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පසුගිය වසර කිහිපය තුළද කිසිදු පියවරක් ගෙන නොතිබුණි. කෙසේ වෙතත් කිසිදු ක්‍රියාකාරකමක් සිදුනොකර සමාගම ස්ථාවර තැන්පතු පොලී ආදායම හා කොටස් සඳහා ලැබූ ලාභාංශ ආදායමින් සමාලෝචිත වර්ෂය සඳහා රු. 6,165,371 ක් හා පසුගිය වසර සඳහා රු. 5,522,293 ක් පරිපාලන වියදම් දරා තිබුණි.<br><br>එහෙයින් සමාගම කිසිදු ක්‍රියාකාරකමක් | භාණ්ඩාගාර මාර්ගෝපදේශ අනුව අධ්‍යක්ෂවරුන්ගේ වියදම් පෙන්වා ඇත. | සමාගමේ ක්‍රියාකාරිත්වය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ දායකත්වය ලබා නොදෙන්නේ නම් ඔවුන් සඳහා ගෙවීම් කිරීමේ යෝග්‍යතාවය පිළිබඳ අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොමැතිව සමාගම පවත්වාගැනීම විගණනයේදී ප්‍රශ්න සහගත විය. | | |
| (ii) | සමාගම සතුව විධිමත් ලිඛිත ව්‍යාපාර සැලැස්මක් හෝ සංයුක්ත සැලැස්මක් නොතිබුණි. | අපගේ ව්‍යාපාර සැලැස්ම වන්නේ, වෙනත් මෙහෙයුම් නොමැති බැවින් ආයෝජන ආදායම වැඩි කිරීමයි. | සමාගම සඳහා විධිමත් ව්‍යාපාර සැලැස්මක් සහ සංයුක්ත සැලැස්මක් සකස් කර ඒ අනුව පියවර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | සමාගම සතුව ලිඛිත මානව සම්පත් සැලැස්මක් නොතිබුණි. | සමාගම තුළ ස්ථිර සේවකයින් නොමැති අතර අර්ධ කාලීන සේවකයින් තිදෙනෙකු පමණක් සිටිති. | ව්‍යාපාර සැලැස්මට අනුව ක්‍රමානුකූලව ස්ථිර සේවකයින් බඳවා ගත යුතුය. |

**04.** **ගිණුම් කටයුතු භාවය සහ පාලනය**

**4.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 6.5.1 වගන්තියට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන, මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් දින 60 ක් ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 116 ක ප්‍රමාදයකින් පසු 2020 අගෝස්තු 25 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදි. | 2005 ජනවාරි 27 දිනැති අංක:පීඊඩී/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ නීති හා උපදේශන යොමු කිරීමට අනුකූල නොවන බව ප්‍රකාශ කර ඇති අතර, 2020 මාර්තු 31 වන දින ගිණුම් වසා දැමූ බව ඔබට දන්වන අතර එම කාලය තුල කොවිඩ් - 19 හේතුවෙන් ඇඳිරි නීතිය පැනවීණි. බැංකුව නිසියාකාරයෙන් ක්‍රියාත්මක නොවීම නිසා බැංකු තහවුරු කිරීම් ලබා ගැනීම ප්‍රමාද විය. | චක්‍ර ලේඛන විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |